# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 34 දරන ශ්‍රී ලංකා කොල්පින් සමාජය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1998 ජුනි මස 15 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 ජුනි මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.75 යි.** **තැපැල් ගාස්තුව : රු. 2.50 යි.**

## 1998 අංක 34 දරන ශ්‍රී ලංකා කොල්පින් සමාජය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 ජූනි මස 15 වැනි දින]

එල්. ඩී.— ඕ. 5/96.

**ශ්‍රී ලංකා කොල්පින් සමාජය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා කොල්පින් සමාජය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ඒ සමාජයේ සාමාජිකයින් එකඟ වූ රීති අනුව ඒ සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු සඵලාකාරයෙන් ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද : පූර්විකාව.

එකී සමාජය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමාජය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී සමාජය සංස්ථාගත කිරීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1998 අංක 34 දරන ශ්‍රී ලංකා කොල්පින් සමාජය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සමාජය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා කොල්පින් සමාජයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්, මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව "ශ්‍රී ලංකා කොල්පින් සමාජය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්විය යුතු අතර එම සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තවද, පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා එය පාවිච්චි කිරීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකා කොල්පින් සමාජය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියන් තුළ ජාතික, ආගමික එකමුතුභාවය වර්ධනය කිරීමට ක්‍රියා කිරීම :

2—D043261—5,900 (97/04)

(ආ) විවිධ ආගමික සිරිත් පිළිබඳ සංවාද ධෛර්යමත් කිරීමෙන් ශ්‍රී ලංකාවේ සාමය සහ සමගිය උදා කරවනු ලබන මානුෂික සහ ආගමික අගයන් ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) ප්‍රජාවට ප්‍රයෝජනවත් වන සියලු දේ ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබාගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ සහ වියදම් කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වුවද ආකාරයක කවර වූ හෝ සියලු ක්‍රියා, කරුණු හෝ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන්නා වූ ද ඒ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජිකයින් සංඛ්‍යාවකින් සමන්විත වන්නා වූ ද විධායක කමිටුවක් විසින් එකී රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු වැඩි ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත සඳහන් කරුණු සියල්ලක්ම හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, නිලධරයන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව හා කාර්යය ;

(ඇ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) සංස්ථාවේ සහ විධායක කමිටුවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම් කැඳවීම හා පැවැත්වීම සහ ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර සහ ඒ රැස්වීම්වල ගණපූරණය හා එහි දී ඉටුකළ යුතු කාර්ය ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වා ගෙන යාම හා විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම එවැනි රැස්වීමක දී සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම හෝ එය ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී බලපැවැත් වූ සමාජයේ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත්විය යුත්තා හ.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**7.** මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයකින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ එවකට බලපවත්නා රීතිවලට යටත්ව ඒ දේපළ උකස් කිරීමේ, විකිණීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සමාජය විසින් ගෙවිය යුතු සහ සමාජයට අයවිය යුතු ණය.

**8.** මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමාජයේ පැවැති සියලු ම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර එදිනට සමාජයට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ සමාජයට ගෙවිය යුතුව තිබුණු සියලු සාමාජික මුදල් හා දායක මුදල්, සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

විගණනය සහ ගිණුම්.

**9.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් —

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එහි ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ සභාපතිවරයා හෝ ඔහු නොමැති විටෙක උප සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයා ඉදිරිපිට දී හැර එය කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් දෙදෙනා විසින් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනකට පරිබාහිරව විය යුතු ය.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.